සංස්ථාපිත හා පුද්ගලික බදුකරණය

විෂය අංකය : 3804

2025/2026 **තක්සේරු වර්ෂය සඳහා**
යාවත්කාලීන කිරීම්

මෙම යාවත්කාලීන කිරීම් පරිශීලනය කළ හැකි වන්නේ
2026 ජනවාරි මස
මුද්‍රණය කරන ලද CPT ග්‍රන්ථයන් සමග පමණි.

වැදගත්:

මෙම විෂය නිර්දේශය යටතේ ඉදිරියේ දී පැවැත්වීමට නියමිත විභාග සඳහා පරීක්ෂා කිරීමට නියමිත තක්සේරු වර්ෂ පහත පරිදි වේ.

විභාගය		තක්සේරු වර්ෂය (Y/A)
2027 - ජනවාරි විභාගය	-	2025/2026

ප්‍රකාශනය:
ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

01 වන පරිච්ඡේදය | ශ්‍රී ලංකාවේ බදුකරණය හැඳින්වීම සහ බදුකරණයේ නව ප්‍රවණතා

-පිටුව 9-

1.5.2 ආදායම් බදු ගණනය කළ යුත්තේ කුමන කාල පරාසයකට වරක් ද?

තෙවන ඡේදයේ (උදාහරණ ලෙස...) පළමු වාක්‍ය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

උදාහරණ ලෙස, 2025/26 තක්සේරු වර්ෂය 2025 අප්‍රේල් 01 සිට 2026 මාර්තු 31 දක්වා කාලසීමාව ආවරණය වේ.

-පිටුව 11-

උදාහරණය: බදුකරණය සඳහා වාසික බව නිර්ණය කිරීම

වගුව සහ අවසාන ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

පැමිණීම	පිටවීම	ශ්‍රී ලංකාව තුළ
03.04.2025	21.05.2025	48
04.06.2025	30.06.2025	26
15.09.2025	14.11.2025	60
01.12.2025	22.12.2025	21
එකතුව		155

ඉහත තොරතුරු අනුව, 2025/26 තක්සේරු වර්ෂය තුළ ඔහු ශ්‍රී ලංකාව තුළ දින 155ක් කායික වශයෙන් ගත කර ඇති නිසා බදු අරමුණු සඳහා පිලිප් මහතා නිර්වාසික පුද්ගලයෙක් සේ සැලකේ.

-පිටුව 12-

පිළිතුර 5

අවසාන පේළිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

යන කරුණු මත ශ්‍රී ලංකාවේ වාසය කිරීම තීරණය වේ.

-පිටුව 14-

1.8 පැවරුම් මිලකරණය

අවසාන ඡේදයේ පළමු වාක්‍ය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2021.03.02 දිනැති 2217/7 දරණ ගැසට් නිවේදනය මගින් පැවරුම් මිල මත නියෝග ප්‍රකාශයට පත් කර ඇති අතර ඒවා 2021 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

-පිටුව 17-

1.11 ඩිජිටල් බදුකරණයේ පැනනැගීම සහ එහි අභියෝග

1. බදු අය කළ හැකි පැවැත්ම නිර්වචනය කිරීම

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ස්ථිර ආයතනය (permanent establishment) පිළිබඳ සාම්ප්‍රදායික සංකල්ප, අන්තර්ජාලය හරහා හෝ භෞතික පැවැත්මකින් තොරව (virtually) ක්‍රියාත්මක වන ව්‍යාපාර සඳහා ප්‍රමාණවත් ලෙස අදාළ කළ නොහැකි අතර ලාභ සඳහා බදු අය කළ යුතු අධිකරණ බලය (රට) තීරණය කිරීම දුෂ්කර වේ.

-පිටුව 18-

විදේශීය ඩිජිටල් සේවාවන් සඳහා එකතු කළ අගය මත බද්ද දීර්ඝ කිරීම

ඉහත ජේදයේ අවසානයට පහත වාක්‍ය ඇතුළත් විය යුතු ය.

මෙය 2026 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

02 වන පරිච්ඡේදය | ආදායම් මූලාශ්‍ර

-පිටුව 25-

2.1.3 ප්‍රතිලාභවල වටිනාකම

පළමු ජේදය (දේශීය ආදායම්...) පහත පරිදි සංශෝධනය විය යුතු ය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිකුත් කළ 2023.04.06 දිනැති SEC/2023/E/02 චක්‍රලේඛය අනුව 2023.04.01 සිට ක්‍රියාත්මක වන මූල්‍ය නොවන ප්‍රතිලාභ වටිනාකම් පහත දැක්වේ.

-පිටුව 25-

2.1.3 ප්‍රතිලාභවල වටිනාකම

වගුවට පහළින් ඇති (ii) ඉවත් කර ඇති අතර ඒ වෙනුවට පහත කොටස එකතු විය යුතු ය.

ii. ඉහත අගය, සේවායෝජකයා විසින් දරණ ලද පිරිවැය හෝ එම වාසස්ථානයේ වෙළෙඳපොළ වටිනාකම ඉක්මවන්නේ නම්, එම අගයන් දෙකෙන් අඩු අගය මෙම කාර්යය සඳහා සේවකයාට ලැබුණු ප්‍රතිලාභයේ වටිනාකම ලෙස සැලකිය යුතු ය.

-පිටුව 28-

2.1.6 ගෙවීම් පදනම

උදාහරණ 1

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ගමගේ මහතා ABC සමාගමේ සේවයේ නියුක්තව සිටී. 2025 දෙසැම්බර් මස දී රුපියල් 500,000ක ප්‍රසාද දීමනාවක් 2024/25 තක්සේරු වර්ෂය සඳහා උපයනු ලැබූ ලාභයෙන් සමාගම විසින් ගෙවනු ලැබීය. 2025/26 තක්සේරු වර්ෂය සඳහා මෙම ප්‍රසාද දීමනාව මත ගමගේ මහතා බදුවලට යටත් විය යුතුය.

-පිටුව 37-

2.2.5.4.1 පොලී වියදම් - (12 වගන්තිය)

උදාහරණ

(ඔහුගේ පුද්ගලික අරමුණු...) යන්නට පසු කොටස් පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2024/2025 තක්සේරු වර්ෂය තුළ දී ඔහු රු.300,000 ක් ණය සඳහා පොලී ගෙවා ඇත. 2025/26 තක්සේරු වර්ෂය තුළ ඔහු කාර්යාල ගොඩනැගිල්ල විකුණා ඇති අතර ණය සඳහා පොලිය රු. 250,000 ක් ගෙවා ඇත.

2024/25 තක්සේරු වර්ෂය තුළ, නිමල් මහතා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ණය මුදලින් 50%ක මුදලක් යොදාගත් අතර එම වත්කම වසර තුළ ව්‍යාපාර කටයුතු සඳහා භාවිත කරන ලද බැවින් 12 (අ) වගන්තිය යටතේ ඔහුට රු. 150,000ක් (ණයවලින් 50%ක්) පොලී ලෙස අඩු කිරීමට හිමිකමක් ඇත. එසේම, සේවක වැටුප් ගෙවීමට භාවිත කළ මුදල් මත ගෙවනු ලබන පොලිය 12 (අ) වගන්තිය අනුව ව්‍යාපාර ආදායම උත්පාදනය කිරීම සඳහා දරන ලද බැවින් නිමල් මහතාට රු. 75,000ක මුදලක් අඩු කිරීමට හිමිකම ඇත. ඔහුගේ පෞද්ගලික අරමුණු සඳහා භාවිත කරන ලද මුදල් වෙනුවෙන් ගෙවන ලද රු. 75,000ක පොලිය අඩු කළ නොහැකිය.

12 (ආ) තවද, කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යොදවා ඇති මුදල් මත 2025/26 තක්සේරු වර්ෂය තුළ ගෙවූ පොලී මුදලින් රු. 125,000ක් අදාළ වර්ෂය තුළ කාර්යාල ගොඩනැගිල්ල ව්‍යාපාර කටයුතු සඳහා භාවිත නොකළ හෙයින් අඩු කිරීමට හිමිකමක් නැත.

-පිටුව 38-

2.2.5.4.2 මූල්‍ය පිරිවැයෙහි අඩු කළ හැකි මුදල යටතේ

දෙවන ඡේදය (2021/22 තක්සේරු වර්ෂය තුළ දී...) ඉවත් විය යුතු ය.

-පිටුව 38-

උදාහරණය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

බී සමාගම ඇඟලුම් කර්මාන්ත ශාලාවක් වන අතර 2025/2026 තක්සේරු වර්ෂය තුළ පොලී වියදම ලෙස රු. 2,500,000 ක් දරා ඇත. 31.03.2026 දිනට සමාගමෙහි ශේෂ පත්‍රය පහත සඳහන් පරිදි අනාවරණය කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය	5,000,000
සංචිත	2,000,000
දිගුකාලීන ණය	30,000,000

මූල්‍ය සාධන පත්‍රවලට ආරෝපණය කළ හැකි මූල්‍ය පිරිවැය ප්‍රමාණය = (රු. 2,500,000/රු. 30,000,000) X [(රු. 5,000,000 + රු. 2,000,000) X 4] = රු. 2,333,333

ඒ අනුව 2025/2026 තක්සේරු වර්ෂය තුළ අඩුකළ හැකි මූල්‍ය පිරිවැය ප්‍රමාණය = රු. 2,500,000.

-පිටුව 43-

වගුවේ 5වන තීරුව ලෙස පහත කොටස එක් විය යුතු ය.

5	01.04.2026 සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක පිහිටුවන ලද නව ව්‍යාපාරික කටයුත්තක භාවිත කරන අස්පර්ශනීය වත්කම් හැර, ක්ෂය වන වත්කම් සඳහා	ඇ.ඩො. 250 000 ඉක්මවන නමුත් ඇ.ඩො. මිලියන 3 නොඉක්මවන	100%

-පිටුව 43-

වගුවට පහතින් ඇති (2) සහ (3) අනු අංක පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2. යම් තක්සේරු වර්ෂයකට අදාළව ඉහත එක් කාණ්ඩයක් යටතේ හටගන්නා ප්‍රාග්ධන දීමනා වෙනත් කාණ්ඩයක් සමග එකතු කළ නොහැකි අතර එම වර්ෂය තුළ දී ලබාගත යුතු අතර පසු තක්සේරු වර්ෂයකට කල් දැමිය නොහැකිය.

   වැඩිකළ ප්‍රාග්ධන දීමනා නිසා හටගන්නා හිලව් නොකළ අලාභ පහත පරිදි ඉදිරියට ගෙන යා හැකිය.

   - ආයෝජනය ඇ.ඩො. මිලියන 1,000ට වැඩි හෝ ඉහත 4 අයිතමය යටතේ නම් අවු. 25
   - වෙනත් අවු. 10

3. මුළු ආයෝජනය සිදු කර නොමැති නම්, ක්ෂය විය හැකි වත්කම් මත ආයෝජනය ක්‍රියාත්මක කිරීමේ වසර 3ක කාලසීමාවක් හිමි වේ. එවිට මුළු ආයෝජනය සම්පූර්ණ කළ තක්සේරු වර්ෂය තුළ දී, නමුත් වසර තුන ඉකුත් වීමට පෙර, ප්‍රාග්ධන දීමනා අඩු කළ යුතු ය.

-පිටුව 48-

බද්දෙන් නිදහස් පොලිය (තුන්වන උපලේඛනය)

'විශේෂ තැන්පතු ගිණුමකින් ලැබෙන පොලිය' යන්න අනු මාතෘකාවක් නොවන අතර බද්දෙන් නිදහස් පොලිය යටතේ එන දෙවන අනු අංකය විය යුතු අතර 3වන අනු අංකය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ණය මුදල බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කරනු ලබන බවට සහ ණය මුදල ශ්‍රී ලංකාව තුළ භාවිත කරන බවට වන කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තෙකුට හෝ ශ්‍රී ලංකා රජයට ප්‍රදානය කර ඇති යම් ණයක් මත ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තෙකු විසින් උපයන හෝ උපචිත වන පොලිය

-පිටුව 50-

2.3.10 ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලාභ (ප්‍රාග්ධන ලාභ)

පළමු ඡේදයේ අවසාන කොටස ලෙස පහත වාක්‍ය ඇතුළත් විය යුතු ය.

- සමාගම් සඳහා 30%
- අනෙකුත් තැනැත්තන් සඳහා 10%

2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව, තනි පුද්ගලයන් සහ හවුල් ව්‍යාපාර සඳහා බදු අනුපාතය 15% දක්වා ද, අනෙකුත් තැනැත්තන් සඳහා බදු අනුපාතය 30% දක්වා ද වැඩි කර ඇත.

-පිටුව 52-

උදාහරණය පළමු ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

X මහතා 2015.12.12 වන දින රු. 3,500,000/-කට ඉඩමක් මිලදීගත් අතර එය ඔහුගේ ආයෝජනයක් ලෙස දරා සිටියි. 2017 සැප්තැම්බර් 30 වන දිනට එම ඉඩමේ වටිනාකම රු. 4,000,000/-ක් විය. 2025.05.01 වන දින එම ඉඩම රු. 6,000,000/-කට විකුණන ලද අතර විකිණීමට පෙර පහත වියදම් දරන ලදී.

-පිටුව 53-

2.4 වෙනත් ආදායම් (8 වන වගන්තිය)

දෙවන ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව, 2024.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් වාහන උපලබ්ධි කිරීමෙන් ලාභ ඇතුළත් නොවේ.

-පිටුව 54-

වෙනත් මූලාශ්‍රවලින් තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීම

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

වෙනත් මූලාශ්‍රවලින් ආදායම්			xxx
අඩු කළා -	බදු නිදහස් ආදායම්	(xx)	
	අවසාන රඳවා ගැනීමේ ගෙවීම්	(xx)	
	සේවා නියුක්තික, ව්‍යාපාර හෝ ආයෝජන ආදායමට ඇතුළත් ආදායම්	(xx)	
	මෝටර් වාහන උපලබ්ධි කිරීමෙන් ලාභ	(xx)	(xx)
බද්දට යටත් වෙනත් ආදායම			xxx
අඩු කළා -	ඉඩදෙන වියදම්		(xx)
තක්සේරු කළ හැකි වෙනත් ආදායම්			**xxx**

03 වන පරිච්ඡේදය | පුද්ගලයෙකුගේ සහ සමාගමක (නේවාසික) බදු තක්සේරු කිරීම

-පිටුව 59-

3.2.1 පුද්ගලයෙකු සහ අස්ථිත්වයක් සඳහා සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන

(a) උප ඡේදය **(i)** පහත පරිදි සංශෝධනය විය යුතු ය.

(i) A - රෝගීන් හෝ අසරණ අයට ආයතනික සත්කාර සැලසීම සඳහා පිහිටුවන ලද පුණ්‍ය ආයතනයකට සහ

B - 2025.04.01 දින සිට සමාජ සේවා සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා පවතින නීතියක් යටතේ ලියාපදිංචි කළ ආණ්ඩුවේ සෞඛ්‍ය හෝ අධ්‍යාපන සේවා සමග සහයෝගයෙන් සෞඛ්‍ය රැකවරණ සේවා පහසුකම් සපයන ආයතනයකට

-පිටුව 61-

3.2.2 සුදුසුකම් ලබන ගෙවීම් සඳහා අදාළ වන සීමාවන්

වගුවට පසුව පහත ඡේදය ඇතුළත් විය යුතු ය.

ඉහත 3.2.1 (b) යටතේ (i) සිට (v) දක්වා පරිත්‍යාගයන්ගෙන් තක්සේරු කළ හැකි ආදායම ප්‍රමාණවත් නොවීම මත අඩු කරගත නොහැකි ප්‍රමාණය ඉදිරි තක්සේරු වර්ෂය සඳහා ඉදිරියට ගෙන යා හැකි ය. (2025/26 තක්සේරු වර්ෂයේ සිට)

-පිටුව 61-

3.2.2 සුදුසුකම් ලබන ගෙවීම් සඳහා අදාළ වන සීමාවන්

'පුද්ගලික සහන' යටතේ **(a)** උප ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

a. 2025.04.01 දින හෝ ඉන් පසු ආරම්භවන එක් එක් තක්සේරු වර්ෂය සඳහා වාසික පුද්ගලයෙකු හෝ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන නිර්වාසික පුද්ගලයකු හට එක් තක්සේරු වර්ෂයකට **රු. 1,800,000/-.**

b. **කුලී ආදායම මත සහනය**

ආයෝජන වත්කමකින් කුලී ආදායම් ලබන වාසික තනි පුද්ගලයකුට අදාළව,

-පිටුව 61-

ප්‍රශ්නය 1

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 62-

පිළිතුර 1

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

පුද්ගලික සහනය හිලව් කිරීම සඳහා පෙරේරා මහතා හිමිකම් ලබන්නේ රු. 2,400,000/-ක ව්‍යාපාර ආදායම සඳහා පමණක් වන අතර රු. 600,000/- ක් වන ආයෝජන ආදායමට හිලව් කළ නොහැකිය. ඒ අනුව, ඔහුගේ බදු අය වන ආදායම රු. 1,200,000/- ක් (600,000 + 2,400,000 - 1,800,000) වේ.

-පිටුව 62-

ප්‍රශ්නය 2

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 62-

පිළිතුර 2

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ඇයට, සේවා නියුක්තික ආදායම, ව්‍යාපාර ආදායම සහ පොලී ආදායම සඳහා මූලික සහනය වන රු. 1 800 000 යෙදවීමට හිමිකම ඇත.

සේවා නියුක්තික ආදායම	800 000
ව්‍යාපාර ආදායම	200 000
ආයෝජන ආදායම - ප්‍රාග්ධන ලාභ	100 000
කුලී ආදායම	300 000
	1 400 000
මූලික සහනය (කොටසක් පමණක් අඩු කළ හැක)	(1 300 000)
කුලී සහනය 300 000 × 25%	-
බදු වන ආදායම	100 000

ඒ අනුව, බදු අය කළ හැකි ආදායම රු. 100,000 වේ.

-පිටුව 62-

ප්‍රශ්නය 3

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 62-

පිළිතුර 3

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

සේවා නියුක්ති ආදායම	3,500,000
අඩු කළා: මූලික සහනය	(1,800,000)
බදු අය කළ හැකි ආදායම	1,700,000

-පිටුව 63-

ප්‍රශ්නය 4

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 63-

පිළිතුර 4

පළමු ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

ඔහුට මූලික සහනය වන රු. 1,800,000/- මෙන්ම කුලී ආදායම සඳහා වන රු. 1,500,000/- සහනය (500,000 x 12 x 25%) ද සම්පූර්ණයෙන් අඩු කරගත හැකිය. ඒ අනුව, බදු අය කළ හැකි ආදායම රු. 2,700,000 කි.

-පිටුව 63-

ප්‍රශ්නය 5 / පිළිතුර 5

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 64-

3.3.1.1 වාසික සහ නිර්වාසික පුද්ගලයන් සඳහා වූ බදු අනුප්‍රමාණ

දෙවන වගුව පහත පරිදි සංශෝධනය විය යුතු ය.

බදු අය කළ හැකි ආදායම	අනුපාත
පළමු රු. 1,000,000	6%
ඊළඟ රු. 500,000	18%
ඊළඟ රු. 500,000	24%
ඊළඟ රු. 500,000	30%
ඉතිරිය	36%

-පිටුව 64-

3.3.2.1 ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලද ලාභ

පහත ඡේදය ඇතුළත් විය යුතු ය.

2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනතින් 15% දක්වා වැඩි කරන ලදී.

-පිටුව 64-

3.3.2.2 සේවාන්ත ප්‍රතිලාභ මත අදාළ වන අඩු බදු අනුප්‍රමාණ

අවසාන ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2025 අංක 02 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව 2025.04.01 දින සිට පහත ආදායම් **උපරිම 15%ක** බද්දට යටත් වේ.

-පිටුව 65-

(විදේශ ප්‍රභවයකින්....) යටතේ ඇති බදු අය කළ හැකි ආදායම හා අනුපාත දැක්වෙන වගුව ඉවත් විය යුතු ය.

-පිටුව 65-

3.3.3 තනි පුද්ගලයන්ට අදාළ වන වැඩි බදු අනුප්‍රමාණ

2025.03.31 දක්වා - 40% ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 65-

3.3.4 සමාගම් සඳහා අදාළ වන බදු අනුප්‍රමාණ

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2025.04.01 දිනෙන් පසු ආරම්භ වන තක් සේරු වර්ෂය සඳහා පහත සඳහන් අනුපාත සමාගම් සඳහා අදාළ වේ.

(1) විදේශ මූලාශ්‍රයකින් උපයාගත් ලාභ, විදේශ මුදල් වශයෙන් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇත්නම් - 15%

(2) ශ්‍රී ලංකාව තුළ හෝ පිටතදී සපයන ලද සේවාවකින්, ශ්‍රී ලංකාවෙන් පිටත භාවිත කිරීම සඳහා යම් පුද්ගලයෙකුට ලබාදෙන සේවාවකින් උපයන ලාභ සහ ආදායම්, එම සේවාව සඳහා ගෙවීම විදේශ මුදල්වලින් ලබාගෙන බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇත්නම් - 15%

(3) ඔට්ටු ඇල්ලීම හා සූදු පැවැත්වීමෙන් ලාභ සහ ආදායම - 45%

(4) අපනයනය හැර ඕනෑම මත්පැන් හෝ දුම්වැටි නිෂ්පාදනය කර විකිණීම - 45%

(5) ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් උපයන ලාභ සහ ආදායම් - 30%

(6) අනෙකුත් සියලු ආදායම් - 30%

-පිටුව 66-

3.3.4.1 වැදගත් අර්ථ නිරූපණ

අනු අංක **(ii), (iii)** ඉවත් විය යුතු ය.

පිටුව 67/68-

අනු අංක **(vi), (vii), (viii)** ඉවත් විය යුතු ය.

-පිටුව 68/69-

3.5 බදු ගණනය කිරීම සඳහා ආකෘතියක්

ආකෘතිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2025/26 තක්සේරු වර්ෂය

සේවා නියුක්ති ආදායම	xxxx		
අඩුකළා:			
නිදහස් ප්‍රමාණ	(xxxx)		
අවසාන රඳවා ගැනීමේ ගෙවීම්	(xxxx)		
බද්දට යටත් සේවා නියුක්ති ආදායම	xxxx		
සේවා නියුක්ති ආදායම		xxxx	
ව්‍යාපාර ආදායම	xxxx		
අඩු කළා:			
නිදහස් ප්‍රමාණ	(XXXX)		
අවසාන රඳවා ගැනීමේ ගෙවීම්	(XXXX)		
සේවා නියුක්ති ආදායමේ ඇතුළත් ආදායම්	(XXX)		
බද්දට යටත් ව්‍යාපාර ආදායම	XXXX		
අඩු කළා: ඉඩදෙන වියදම්	(XXXX)		
ව්‍යාපාර ආදායම		XXXX	
ආයෝජන ආදායම	xxxx		

අඩු කළා:			
නිදහස් ප්‍රමාණ	(XXXX)		
අවසාන රඳවා ගැනීමේ ගෙවීම්	(XXXX)		
සේවා නියුක්ති ආදායමේ සහ ව්‍යාපාර ආදායමේ ඇතුළත් ආදායම්	(XX)		
බද්දට යටත් වන ආයෝජන ආදායම	XXXX		
අඩු කළා: ඉඩදෙන වියදම්	(XXXX)		
ආයෝජන ආදායම්		XXXX	
වෙනත් මූලාශ්‍රවලින් ආදායම	xxxx		
අඩුකළා:			
නිදහස් ප්‍රමාණ	(XXXX)		
අවසාන රඳවා ගැනීමේ ගෙවීම්	(XXXX)		
සේවා නියුක්ති ආදායමේ, ව්‍යාපාර ආදායමේ සහ ආයෝජන ආදායමේ ඇතුළත් ආදායම් / මෝටර් රථ උපලබ්ධි ලාභ	(XXXX)		
බද්දට යටත් වන වෙනත් මූලාශ්‍ර ආදායම	XXXX		
අඩු කළා: ඉඩදෙන වියදම්	(XXXX)		
වෙනත් මූලාශ්‍ර ආදායම		XXXX	
තක්සේරු කළ හැකි ආදායම			**XXXX**
අඩු කළා:			
සුදුසුකම් ලබන ගෙවීම්		(XXXX)	
සහන		(XXXX)	
තනි පුද්ගලයන් සඳහා පුද්ගලික සහනය රු. 1,800,000/- (වාසික සහ නිර්වාසික ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා)		(XXXX)	
		(XXXX)	
කුලී ආදායමෙන් 25%ක සහනය (වාසික තනි පුද්ගලයන් සඳහා පමණි)		(XXXX)	
බදු අය කළ හැකි ආදායම			**XXXX**
ආදායම් බද්ද (පළමු උපලේඛනයේ සඳහන් අනුපාත අනුව)			**XXXX**
අඩු කළා : බදු බැර			
විදේශීය		(XXXX)	
දේශීය - රඳවා ගැනීමේ බදු, කාර්තුමය ගෙවීම්		(XXXX)	
ඉතිරි ගෙවිය යුතු බද්ද (වැඩිපුර ගෙවූ බද්ද)			**XXXX**

-පිටුව 71-

(i) හි අනු අංක **(ii)** අවසානයට පහත ජේදය ඇතුළත් විය යුතු ය.

මෙහිදී ණය මුදල බැංකුවක් හරහා විදේශ මුදලින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර තිබිය යුතු අතර ණය මුදල ශ්‍රී ලංකාව තුළ භාවිත කර තිබිය යුතු ය.

-පිටුව 75-

ප්‍රශ්නය 6

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 76-

පිළිතුර 6

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

සේවා නියුක්තික ආදායම	2,000,000
ව්‍යාපාර ආදායම	1,300,000
ආයෝජන ආදායම	200,000
තක්සේරු කළ හැකි ආදායම	**3,500,000**
අඩුකළා : සහන	
පුද්ගල සහනය	(1,800,000)
බදු අය කළ හැකි ආදායම	**1,700,000**

-පිටුව 76-

ප්‍රශ්නය 7

තක්සේරු වර්ෂය 2025/2026 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 76-

ප්‍රශ්නය 7

(1) යටතේ සඳහන් දෙවන අනු කොටස පහත පරිදි සංශෝධනය විය යුතු ය.

- රු. 200,000/- ක ප්‍රසාද දීමනාවක් 2026 මාර්තු මාසයේ දී ලැබුණි.

-පිටුව 77-

පිළිතුර 7

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

	සටහන් අංකය	**රු.**	**රු.**
සේවා නියුක්තික ආදායම	01		3,740,000
ආයෝජන ආදායම	02		821,500
දරුවාගේ ආදායම - වෙනමම තක්සේරු කළ යුතුය.			-
තක්සේරු කළ හැකි ආදායම			4,561,500
අඩු කළා - සහන			

පුද්ගල සහන		1,800,000	
කුලී ආදායම මත සහනය (600,000x25%)		150,000	(1,950,000)
සුදුසුකම් ලබන ගෙවීම්			
ජාතික වකුගඩු අරමුදලට මුදල් පරිත්‍යාග			(100,000)
ගමේ පන්සලට මුදල් පරිත්‍යාග - අඩු කළ නොහැක			-
බදු අය කළ හැකි ආදායම			2,511,500
පළමු 500,000 x 6%		60,000	
ඊළඟ 500,000 x 18%		90,000	
ඊළඟ 500,000 x 24%		120,000	
ඊළඟ 500,000 x 30%		150,000	
ඉතිරි 611,500 x 36%		4,140	424,140
අඩුකළා - බදු බැර			
APIT		45,000	
වාරික ගෙවීම		10,000	(55,000)
ගෙවිය යුතු ඉතිරි බද්ද			**369,140**

-පිටුව 78-

ප්‍රශ්නය 8

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

සීමාසහිත ඒබීසී පුද්ගලික සමාගම දේශීය වෙළෙඳපොළ සඳහා පාවහන් නිෂ්පාදනය කිරීමේ නිරතව සිටින සමාගමකි. 2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වෙළෙඳාමෙන් මුළු පිරිවැටුම රු. මිලියන 558ක් වන අතර 2026.03.31 දිනට ස්කන්ධ ප්‍රාග්ධනය (කොටස් ප්‍රාග්ධනය + සංචිත) රු. 10,000,000කි. 2026.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සහ අනෙකුත් තොරතුරු පහත දැක්වේ.

-පිටුව 79-

ප්‍රශ්නය 8

ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් යටතේ ඇති පළමු ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2023/24 තක්සේරු වර්ෂයේ දී ලබාගත් බැංකු ණය සඳහා ගෙවූ පොලිය (2025.03.31 දිනට ණය ශේෂය රු. 44,900,000කි.)

-පිටුව 79/80-

පිරිවැය වගුව සහ සමුච්චිත ක්ෂය වගුව පහත පරිදි සංශෝධනය විය යුතු ය.

පිරිවැය

වත්කම් වර්ගය	2025 අප්‍රේල් 01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	ඉවත් කිරීම් රු.	2026 මාර්තු 31 දිනට ශේෂය රු.
ගොඩනැගිලි	15,000,000	-	-	15,000,000
යන්ත්‍ර	21,000,000	3,675,000	-	24,675,000
පරිගණක	1,450,000	120,000	-	1,570,000
දේශීයව සංවර්ධනය කළ මෘදුකාංග	500,000	-	-	500,000
මෝටර් වාහන	6,650,000	8,400,000	(4,000,000)	11,050,000
ගෘහභාණ්ඩ	1,240,000	50,000	-	1,290,000
අස්පෘශ්‍ය වත්කම්	-	2,000,000	-	2,000,000
එකතුව	45,840,000	14,245,000	(4,000,000)	56,085,000

සමුච්චිත ක්ෂය

වත්කම් වර්ගය	2025 අප්‍රේල් 01 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ක්ෂය රු.	ඉවත් කිරීම් රු.	2026 මාර්තු 31 දිනට ශේෂය රු.
ගොඩනැගිලි	6,750,000	750,000	-	7,500,000
යන්ත්‍ර	9,750,000	1,252,000	-	11,002,000
පරිගණක	1,015,000	170,000	-	1,185,000
දේශීයව සංවර්ධනය කළ මෘදුකාංග	300,000	100,000	-	400,000
මෝටර් වාහන	3,542,000	2,337,000	(1,500,000)	4,379,000
ගෘහභාණ්ඩ	1,116,000	136,000	-	1,252,000
අස්පෘශ්‍ය වත්කම්	-	400,000	-	400,000
එකතුව	22,473,000	5,145,000	(1,500,000)	26,118,000

-පිටුව 80-

3වන අනු අංකය යටතේ තක්සේරු වර්ෂය 2022/23 ලෙස සංශෝධනය විය යුතු ය.

7වන අනු අංකය යටතේ දිනය 2025.04.01 ලෙස සංශෝධනය විය යුතු ය.

12වන අනු අංකය යටතේ තක්සේරු වර්ෂය 2024/25 ලෙස සංශෝධනය විය යුතු ය.

12වන අනු අංකයට පසුව දැක්වෙන තක්සේරු වර්ෂය 2025/26 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 80/81/82-

පිළිතුර 8

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2025/26 තක්සේරු වර්ෂය සඳහා බදු ගණනය කිරීම

					+	-
					රු.	රු.
බද්දට පෙර ලාභය					9,240,000	

කුලී ආදායම						5,400,000
ලාභාංශ - ආයෝජන ආදායම්						1,720,000
භාණ්ඩාගාර බැඳුම්කර මත පොලිය - ආයෝජන ආදායම්						1,600,000
ලොරි රථය විකිණීමේ ගිණුම්කරණ ලාභය					1,200,000	
තුලනය කිරීමේ දීමනාව						
ලාභය/අලාභය = 1,300,000 -(4,000,000 – (4,000,000x20x3) = 1,300,000 – 1,600,000 අලාභය = (300,000)						300,000
ගිණුම්කරණ ක්ෂය					4,745,000	
ක්‍රමක්ෂය					400,000	
ප්‍රාග්ධන දීමනා	අත්පත් කර ගත් දිනය	පිරිවැය				
ගොඩනැගිලි	17/18	15,000,000	10%			1,500,000
යන්ත්‍ර	17/18	21,000,000	33.33%	සම්පූර්ණයෙන් අඩු කර ඇත		-
යන්ත්‍ර	25/26	3,675,000	වසර 5			735,000
පරිගණක	17/18	1,450,000	25%	සම්පූර්ණයෙන් අඩු කර ඇත		
පරිගණක	25/26	120,000	වසර 5			24,000
දේශීය මෘදුකාංග	17/18	500,000	100%	සම්පූර්ණයෙන් අඩු කර ඇත		-
විකුණූ ලොරි රථය	18/19	4,000,000	ප්‍රාග්ධන දීමනා නැත			-
වාහන - ඉතිරිය	17/18	2,650,000	20%	සම්පූර්ණයෙන් අඩු කර ඇත		530,000
කල් බදු ලොරි රථය	25/26	6,400,000	වසර 5			1,280,000
මෝටර් රථය	25/26	2,000,000	ප්‍රාග්ධන දීමනා නැත			-
ගෘහ භාණ්ඩ	17/18	1,240,000	20%			248,000
ගෘහ භාණ්ඩ	25/26	50,000	වසර 5	සම්පූර්ණයෙන් අඩු කර ඇත		10,000
අස්පෘශ්‍ය වත්කම	25/26	2,000,000	වසර 20			100,000
අළුත්වැඩියා රු.60,000 - ඉඩදේ						
ඉදිකිරීමේ පිරිවැය - ප්‍රාග්ධන ස්වරූපය					600,000	
වැඩි දියුණු කිරීම්						
31.03.2025 දින බදු මත ලියා හළ අගය		3,000,000	(15,000,000 x 10% x 2)			
	ලියා හළ අගයෙන් 5%	150,000				
සත්‍ය පිරිවැය		600,000				150,000

කළමණාකරුගේ නිවස සඳහා ගෙවූ දළ කුලිය					504,000	
කළමණාකරුගේ මාසික පාරිශ්‍රමිකය			170,000			
නිවාස ප්‍රතිලාභය - නිදහස්						
බොල් හා අඩමාන ණය සඳහා වෙන් කිරීම					280,000	
ලියා හැරීම - සම්පූර්ණයෙන් ඉඩදේ						
සංග්‍රහ වියදම් - ඉඩනොදේ					210,000	
කුලී - ඉඩ දේ.						
පරිත්‍යාග					1,000,000	
ගෙවූ පොලිය (18 වන වගන්තිය)						
කොටස් ප්‍රාග්ධනය + සංචිත				10,000,000		
A X B (B=4)			10,000,000 x 4 = 40,000,000			
ගෙවූ පොලිය				7,000,000		
ණය		44,900,000				
කල් බදු ප්‍රාග්ධනය (6,400,000 – 1,300,000)		5,100,000		50,000,000		
(වෙනත් ණයහිමියන් නොමැති බව උපකල්පනය කර)						
ඉඩදිය හැකි මූල්‍ය වියදමට අදාළ මූල්‍ය සාධනපත්‍ර ප්‍රමාණය			7/50 = 0.14			
ඉඩ දිය හැකි ප්‍රමාණය = (A x B x අනුපාතය)			40,000,000 x 0.14	5,600,000		
ඉඩ නොදෙන ප්‍රමාණය (ඉදිරියට ගෙන යා හැක)			7,000,000-5,600,000		1,400,000	
(අනෙකුත් සියළු වියදම් පාලනය නොකළ ගනුදෙනුවලින්, ආදායම ලබා ගැනීමේ දී දරන ලද වියදම් බව උපකල්පනය කරන්න).						
					19,579,000	7,419,000
අලාභවලට පෙර ගලපන ලද ලාභය					2,160,000	
අඩු කළා ඉදිරියට ගෙන ආ අලාභ					(5,000,000)	
ව්‍යාපාර ආදායම					7,160,000	
ආයෝජන ආදායම - සටහන 01					1,600,000	
තක්සේරු කළ හැකි ආදායම					**8,760,000**	
සුදුසුකම් ලබන ගෙවීම්						
බදු අය කළ හැකි ආදායමෙන් 1/5 හෝ රු. 500,000 යන දෙකෙන් අඩු ගණන					(500,000)	
බදු අය කළ හැකි ආදායම					8,260,000	
බදු වගකීම ව්‍යාපාර ආදායම -			8,260,000 x 30%			2,478,000
අඩු කළා : බදු බැර						-
ගෙවිය යුතු ඉතිරි බද්ද						**2,478,000**

04 වන පරිච්ඡේදය | විවිධ ව්‍යාපාරවල බදුකරණය

-පිටුව 88-

පළමු ඡේදය (ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන්...) අවසානයට පහත කොටස ඇතුළත් විය යුතු ය.

2026 අංක 11 දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව, හවුල් ව්‍යාපාර සඳහා අදාළ ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය 15% දක්වා ඉහළ නංවා ඇත.

-පිටුව 89-

වගුවේ පළමු පේළියෙහි (බදු අනුපාතය යටතේ) අවසානය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

15% (2026.06.08 සිට)

-පිටුව 89-

ප්‍රශ්නය 1

තක්සේරු වර්ෂය 2025/26 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 89-

පිළිතුර 1

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම		=	රු. 20,000,000
හවුල් ව්‍යාපාරයේ ආයෝජන ආදායම		=	රු. 500,000
තක්සේරු කළ හැකි ආදායම			රු. 20,500,000
බදු අයවන ආදායම පළමු රු. 1,000,000		=	රු. 20,500,000
ඉතිරිය මත බද්ද 6% බැගින් 1,950,000 x 6%		=	රු. 1,170,000
A මහතාගේ හවුල් ව්‍යාපාර කොටස		=	රු. 10,250,000
B මහතාගේ හවුල් ව්‍යාපාර කොටස		=	රු.10,250,000
A මහතා විසින් ගෙවිය යුතු බද්ද			
A මහතාගේ හවුල් ව්‍යාපාර කොටස		=	10,250,000
අඩු කළා : දීමනාව		=	(1,800,000)
බදු අය කළ හැකි ආදායම		=	8,450,000
6% බැගින් පළමු රු. 2,500,000 =	420,000		
ඉතිරිය මත 36% =	2,142,000		
මුළු බද්ද			2,562,000
අඩුකළා : හවුල් ව්‍යාපාර බද්ද (1,170,000 x 50%)		=	(585,000)
ගෙවිය යුතු බද්ද		=	1,977,000

-පිටුව 91-

4.2.2.1.1 භාර මත බද්ද පැනවීම

අවසාන ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

භාර, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලාභ මත 10% බැගින් ද අනෙකුත් බද්දට යටත් වන ආදායම් මත 30% (2025/2026 තක්සේරු වර්ෂය සඳහා) බැගින්ද බදු ගෙවිය යුතු වේ. (2026.06.08 දින සිට ප්‍රාග්ධන ලාභ බද්ද 30%ක් වේ.)

-පිටුව 91/92-

ප්‍රශ්නය 2

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

වරුණි සහ තනුජා නිවුන් සහෝදරියන් වන අතර ඔවුන්ගේ පියා වන මෙත්තානන්ද මහතා විසින් පිහිටුවූ අවලංගු කළ නොහැකි භාරයක අර්ථලාභීන්ය. භාරය, වෘත්තීය භාරකරුවකු වන වීරක්කොඩි මහත්මිය විසින් කළමනාකරණය කරනු ලබන අතර භාරයේ ආදායමෙන් රු. මිලියන 1 ක වාර්ෂික ගාස්තුවක් ඇයට ගෙවනු ලැබේ. භාර ඔප්පුව අනුව, භාරයේ වත්කම්, ගොවීන්ට රු. මිලියන 40කට කුලියට දුන් (එයින් කුලී ආදායමක් ලබන) විශාල ගොවිබිම් තුනකින් සමන්විත වේ. මෙම ඉඩම භාරකරු විසින් කළමනාකරණය කළ යුතු අතර අර්ථලාභීන්ගේ ඉදිරි ජීවිත කාලය පුරා ඔවුන්ගේ අධ්‍යාපන හා සෞඛ්‍ය වියදම් සඳහා පමණක් ආදායම භාවිත කළ යුතුය. වරුණි හා තනුජා යන දෙදෙනාටම වයස අවු. 21ට එළඹීමෙන් පසු, රුපියල් මිලියන 10 බැගින් කුලී ආදායමෙන් ඉල්ලා සිටීමට අයිතිය ඇත. මෙම දෙදෙනා 2025 ජූලි 01 වන දින අවු. 21ට එළඹෙයි. භාරයේ තක්සේරු වර්ෂය 2026 මාර්තු 31 දිනෙන් අවසන් වෙයි.

2025/26 තක්සේරු වර්ෂය සඳහා වරුණි, තනුජා සහ භාරයේ බදු වගකීම වෙන් වෙන්ව ගණනය කරන්න.

-පිටුව 92-

පිළිතුර 2

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

තැනැත්තා	කුලී ආදායම	අඩුකිරීම්	සහන	බදු අය කළ හැකි ආදායම
වරුණි (තනි පුද්ගල)	මිලියන 10	250,000	1,800,000	7,950,000
තනුජා (තනි පුද්ගල)	මිලියන 10	250,000	1,800,000	7,950,000
භාරය (අස්තිත්වය)	මිලියන 20	500,000	-	19,500,000

-පිටුව 93/94-

තක්සේරු වර්ෂයට පසුව එළඹෙන... ලෙස ආරම්භ වන පළමු ඡේදයට පෙර පහත කොටස ඇතුළත් විය යුතු ය. (4.3.2.1 සුදුසුකම් ලබන ආයෝජන ව්‍යාපාරයක් සිදු නොකරන ඒකක භාර)

2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව 2025/26 සිට

-පිටුව 94-

4.4 රාජ්‍ය නොවන සංවිධාන

(b) හි පළමු අනු කොටසේ තක්සේරු වර්ෂය 2025/26 ලෙස සංශෝධනය විය යුතු ය.

අවසාන අනු කොටස පහත පරිදි සංශෝධනය විය යුතු ය.

තවද ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලබන ලැබීම් මත 10%ක අනුප්‍රමාණයකින් බදු ගෙවිය යුතුය. 2026.06.08 සිට ප්‍රාග්ධන ලාභ බද්ද 30%කි.

-පිටුව 94-

ප්‍රශ්නය 3

තක්සේරු වර්ෂය 2025/26 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 95-

4.5 පුණ්‍යායතන

(i) හි පළමු අනු කොටසේ අවසානයට පහත කොටස ඇතුළත් කළ යුතු ය.

2026 අංක 11 දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව, 5වන උපලේඛනයේ 1 වන ජේදයේ (a) උපජේදයේ සඳහන් ආයතනයක් සම්බන්ධයෙන්, 2025 අප්‍රේල් 1 දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි, සඳහන් සේවාවන් සැපයීමේ පිරිවැය එම ආයතනය විසින් දරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, එම ආයතනයේ අදාළ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු බදු ප්‍රමාණයට සමාන බදු සහනයක් (Tax credit) කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙනු ලැබේ.

-පිටුව 96-

ප්‍රශ්නය 4

තක්සේරු වර්ෂය 2025/26 ලෙස සංශෝධනය විය යුතු ය.

05 වන පරිච්ඡේදය | බැඳීම් සහ ක්‍රියාපටිපාටි

-පිටුව 99-

5.1.1.2 බදු වාරික ගණනය කළ යුත්තේ කෙසේ ද?

සමීකරණය පහත පරිදි සංශෝධනය විය යුතු අතර ඉන්පසු ඇති අනු කොටස් සහ 'සටහන' ඉවත් විය යුතු ය.

වාරිකය	**= $\frac{A - C}{B}$**

- A = 2025/26 තක්සේරු වර්ෂය දක්වා, අදාළ තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගතව ගෙවිය යුතු බදු මුදල

  2026/27 තක්සේරු වර්ෂයේ සිට පෙර තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු බදු මුදල
- B = අදාළ තක්සේරු වර්ෂය සඳහා ඉතිරිව ඇති වාරික සංඛ්‍යාව
- C = ගෙවා ඇති වාරික + වාරිකයේ නියමිත දින දක්වා රඳවා ගැනීමේ බදු

-පිටුව 100-

5.1.1.3 ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය

පළමු ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 91 යන වගන්ති ප්‍රකාරව 2025/26 දක්වා, ආදායම් බද්දට යටත් සෑම තැනැත්තෙකුම යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද පිළිබඳව ඇස්තමේන්තුගත ප්‍රකාශයක්, ඉදිරිපත් කළ යුතු අතර ඇස්තමේන්තුගත බද්ද වාරික හතරකින් ගෙවීම කළ යුතුය. ඇස්තමේන්තුව පසුව වෙනස් වූයේ නම්, සංශෝධිත ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.

-පිටුව 100-

5.1.1.3 ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශය

දෙවන අනු කොටස පහත පරිදි සංශෝධනය විය යුතු ය.

- වර්තමාන තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බද්ද පෙර තක්සේරු වර්ෂයේ ගෙවිය යුතු ආදායම් බද්දට වඩා අඩු වන්නේ නම්, එම තැනැත්තා විසින් ඒ සඳහා හේතු කොමසාරිස් ජනරාල්වරයා වෙත දැක්විය යුතුය. (මෙය ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බදු ප්‍රකාශයේ ම සඳහන් කළ හැකිය.) 2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව 26/27 සිට SET Form අවශ්‍ය නොවේ.

-පිටුව 100-

ප්‍රශ්නය 1

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

සරත් 2025/26 තක්සේරු වර්ෂය සඳහා රු. 900,000/- ක් ගෙවිය යුතු බද්ද ලෙස ඇස්තමේන්තුගත කර ඇත. පළමු වාරිකය ලෙස රු. 225,000/- ක් ගෙවා ඇත. 2025 නොවැම්බර් 15 දක්වා අත්තිකාරම් ආදායම් බදු (AIT) බැර රු. 45,000/- කි.

- දෙවන වාරිකය සඳහා ගෙවිය යුතු වාරිකය ගණනය කරන්න.
- ගෙවිය යුතු නියමිත දිනය සඳහන් කරන්න.

-පිටුව 100-

පිළිතුර 1

'නියමිත දිනය' පහත පරිදි සංශෝධනය විය යුතු ය.

නියමිත දිනය - 2025 නොවැම්බර් 15

-පිටුව 101-

5.1.2 තක්සේරු මත ගෙවිය යුතු බද්ද

පහත කොටස අවසානයට එකතු විය යුතු ය.

උදා :- ත/ව 2025/26 - 2026 සැප්තැම්බර් 30

-පිටුව 101-

5.2.2 ඕනෑම තැනැත්තෙකු විසින් ලියාපදිංචි වීම

අවසාන ඡේදයට පසු පහත කොටස එකතු විය යුතු ය.

2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව සෑම සමාගමක් ම සංස්ථාපනයෙන් දවස් 30ක් ඇතුළත ලියාපදිංචි විය යුතු ය.

-පිටුව 102-

5.2.4 වාර්තාවක් ගොනු කරන ලෙස නියම කරන දැන්වීම

අවසාන ඡේදයට පසු පහත කොටස එකතු විය යුතු ය.

2023 අප්‍රේල් මස 1 වන දින සිට, සෑම තැනැත්තෙකු විසින් ස්වකීය බදු වාර්තා පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංගයක් භාවිත කිරීම මඟින් ඉලෙක්ට්‍රොනිකව පමණක් ගොනු කරනු ලැබිය යුතු ය." නමුත් 2025/26 සිට බදු වාර්තා ලිඛිතව ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අවසර ඇත.

-පිටුව 102-

ප්‍රශ්නය 2

තක්සේරු වර්ෂය 2025/26 ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 102-

පිළිතුර 2

(i) පහත පරිදි සංශෝධනය විය යුතු ය.

(i) 2025/26 තක්සේරු වර්ෂය සඳහා වාර්ෂික ආදායම් වාර්තාව තක්සේරු වර්ෂය අවසන් වීමෙන් මාස 08කට නොවැඩි කාලයක් තුළ ආදායම් වාර්තාව ඉදිරිපත් කළ යුතුය. එනම්, 2026 නොවැම්බර් 30 වන දිනට පෙර

-පිටුව 104/105-

5.3.5 කාල කඩඉම් ප්‍රතිපාදන (135 වගන්තිය)

(3) අනු කොටස පහත පරිදි සංශෝධනය විය යුතු ය.

3. සංශෝධිත තක්සේරු දැන්වීම බදු ගෙවන්නාට භාර දීමෙන් වසරක් ඇතුළත 2025 අප්‍රේල් 1 දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සිට, පුද්ගලයෙකු විසින් යම් තක්සේරු වර්ෂයක් සඳහා ('වත්මන් තක්සේරු වර්ෂය') පහත කරුණු සපුරාලන්නේ නම්,
   (a) ආදායම් වාර්තාවක් ගොනු කර ඇති අතර, එහි ප්‍රකාශිත ගෙවිය යුතු බද්ද, වත්මන් තක්සේරු වර්ෂයට පෙර පැවති ආසන්න තක්සේරු වර්ෂයේ බදු ගෙවිය යුතු ආදායම මත ගෙවිය යුතු බද්දෙන් අවම වශයෙන් 120% හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලෙස ප්‍රකාශ කර තිබේ නම්,
   (b) බදු ආපසු ගෙවීමක් (Tax refund) ඉල්ලා නොසිට, ගෙවිය යුතු සම්පූර්ණ බදු මුදල ගෙවා තිබේ නම් සහ
   (c) වත්මන් තක්සේරු වර්ෂයට අදාළ බදු ගෙවීම් සම්බන්ධයෙන් කිසිදු වංචාවක්, බදු මගහැරීමක් හෝ චේතනාන්විත පැහැර හැරීමක් සිදු වී නොමැති බව සඳහන් කරන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර තිබේ නම්,

   එම ආදායම් **වාර්තාව** නිසි පරිදි ගොනු කර ඇති ප්‍රකාශනයක් ලෙස පිළිගත යුතු අතර, වත්මන් තක්සේරු වර්ෂයට අදාළව එම ප්‍රකාශනය සම්බන්ධයෙන් සංශෝධිත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් නිකුත් නොකළ යුතු ය.

06 වන පරිච්ඡේදය | රඳවා ගැනීමේ බදු (WHT) සහ ප්‍රාග්ධන ලාභ බදු

-පිටුව 120-

6.1.2.2 ආයෝජන ප්‍රතිලාභවලින් (84, 84A වගන්ති) සහ සේවා ගාස්තු හා කොන්ත්‍රාත් ගෙවීම්වලින් (85 වගන්තිය) බද්ද රඳවා ගැනීම (අත්තිකාරම් ආදායම් බද්ද)

වගුවේ 3වන පේළියේ (ඇ) උප වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

(ඇ) වෛද්‍යවරයෙකු, ඉංජිනේරුවරයෙකු, ගණකාධිකාරීවරයෙකු, නීතිඥයෙකු, මෘදුකාංග සංවර්ධනකරුවෙකු, පර්යේෂකයෙකු, අධ්‍යාපනවේදියෙකු, විගණකවරයෙකු, නිරූපණ ශිල්පියෙකු, පෞද්ගලික පුහුණුකරුවෙකු, ක්‍රීඩා පුහුණුකරුවෙකු, තක්සේරුකරුවෙකු, කලාකරුවෙකු, නළුවෙකු, නර්තන ශිල්පියෙකු, ගායකයෙකු, සංගීතඥයෙකු, උත්සව සංවිධායකවරයෙකු, ඡායාරූප ශිල්පියෙකු, වීඩියෝ ශිල්පියෙකු, චිකිත්සකවරයෙකු, මනෝචිකිත්සකවරයෙකු, රූපලාවන්‍ය ශිල්පියෙකු,

අරක්කැමියෙකු, විදුලි කාර්මික ශිල්පියෙකු, දන්ත වෛද්‍යවරයෙකු, පශු වෛද්‍යවරයෙකු, සමාජ මාධ්‍ය පිළිබඳ විශේෂඥයෙකු, සන්නාම තානාපතිවරයෙකු, ක්‍රීඩකයෙකු, තොරතුරු තාක්ෂණය පිළිබඳ විශේෂඥයෙකු, ප්‍රචාරණ නියෝජිතයෙකු, උපදේශකයෙකු, භාෂා පරිවර්තකයෙකු, ලේඛකයෙකු, ණය එකතු කරන්නෙකු හෝ නියමයක් මගින් නියෝග කර ඇති ස්වාධීන සේවා සපයන්නෙකු ලෙස ස්වාධීන සේවා සපයන්නෙකුගේ තත්ත්වයෙන් යුක්ත එවැනි පුද්ගලයෙකු විසින් සපයන සේවා සඳහා

-පිටුව 120-

6.1.2.2 ආයෝජන ප්‍රතිලාභවලින් (84, 84A වගන්ති) සහ සේවා ගාස්තු හා කොන්ත්‍රාත් ගෙවීම්වලින් (85 වගන්තිය) බද්ද රඳවා ගැනීම (අත්තිකාරම් ආදායම් බද්ද)

වගුවේ 4වන පේළිය ලෙස පහත කොටස එක් විය යුතු ය.

2025.03.31 දක්වා ගෙවූ පොලී හෝ වට්ටම්	5%

-පිටුව 124-

6.2.1.6 ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය

අවසාන ජේදය ලෙස පහත කොටස එකතු විය යුතු ය.

2026 අංක 11 දරණ දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව, පුද්ගලයන් හා හවුල් ව්‍යාපාර සඳහා අදාළ ප්‍රාග්ධන ලාභ බද්ද අනුපාතය 15% දක්වා වැඩි කර ඇත. තවද, පුණ්‍යායතන හැර අනෙකුත් සියලුම ආයතන සඳහා 30%ක බදු අනුපාතයක් අදාළ වේ.

-පිටුව 127-

විසඳුම්

(1) පහත පරිදි සංශෝධනය විය යුතු ය.

1 ඒ මහතා - මාසික පාරිශ්‍රමිකය රු. 150,000 ට අඩු නිසා බදු අඩු කළ යුතු නොවේ.

බී මහතා - බදු චක්‍ර අංක 01 අදාළ කළ යුතුය

සී මහතා - බදු චක්‍ර අංක 07 අදාළ කළ යුතුය

07 වන පරිච්ඡේදය | එකතු කළ අගය මත බද්ද (VAT) සහ ව්‍යාපාර සඳහා වන වෙනත් බදු

-පිටුව 131-

7.1.2.1 එකතු කළ අගය මත බදු වගකීම (2 වගන්තිය)

3වන අනු අංකය ලෙස පහත කොටස එක් විය යුතු ය.

3. 2026.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිර්වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තෙකු වෙත ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා කරන සැපයුම් මත

-පිටුව 131/132-

7.1.2.1 එකතු කළ අගය මත බදු වගකීම (2 වගන්තිය)

(v) ලෙස පහත කොටස එක් විය යුතු ය.

(v) නිර්වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ තැනැත්තෙකු වෙත ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා කරන සැපයුම්

-පිටුව 134/135-

7.1.3.2 බදු ඉන්වොයිසියක සංයුතිය

'බදු ඉන්වොයිසි පත්‍රයේ පහත දෑ දක්වා තිබිය යුතු ය.' යටතේ පහත කරුණු සහ ආකෘතිය ඇතුළත් විය යුතු ය.

(අ) VAT ලියාපදිංචි සහතිකය පරිදි සැපයුම්කරු පිළිබඳ විස්තර.
(ආ) VAT ලියාපදිංචි සහතිකය පරිදි ගැනුම්කරු පිළිබඳ විස්තර
(ඇ) ඉන්වොයිසියේ අනුක්‍රමික අංකය, දිනය, සැපයුම් ස්ථානය
(ඈ) සැපයුම පිළිබඳ විස්තර
(ඉ) ගෙවීම් කරන ආකාරය
(ඊ) සෑම ඉන්වොයිසියකම, "බදු ඉන්වොයිසිය" යන වචන පැහැදිලිව මාතෘකාව ලෙස සඳහන් කළ යුතුය.

බදු ඉන්වොයිසිය

ඉන්වොයිසි දිනය:

බදු ඉන්වොයිසි අංකය:

සැපයුම්කරුගේ TIN අංකය:
සැපයුම්කරුගේ නම:
ලිපිනය:

දුරකථන අංකය*:

ගැනුම්කරුගේ TIN අංකය:
ගැනුම්කරුගේ නම:
ලිපිනය:

දුරකථන අංකය*:

සැපයුම් කරන දිනය:

සැපයුම් කරන ස්ථානය*:

අතිරේක තොරතුරු, තිබේ නම්*:

යොමුව*	භාණ්ඩ හෝ සේවා පිළිබඳ විස්තරය	ප්‍රමාණය	ඒකක මිල	එ.අ.බ. හැර වටිනාකම (රු.)
සැපයුමේ මුළු වටිනාකම:				
එ.අ.බ. මුදල (සැපයුමේ මුළු වටිනාකම @ එ.අ.බ. අනුපාතිකය)				
එ.අ.බ. සහිතව මුළු මුදල/ප්‍රතිෂ්ඨාව:				

මුළු මුදල වචනයෙන්*:

ගෙවීම් කරන ආකාරය*:

-පිටුව 144-

ප්‍රශ්නය 9

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

2025.12.31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු ගෙවීමට නියමිත දිනයන් සඳහන් කරන්න.

-පිටුව 144-

ප්‍රශ්නය 10

'අවසන් කාර්තුව 2025 දෙසැම්බර් 31' ලෙස සංශෝධනය විය යුතු ය.

-පිටුව 144-

පිළිතුර 9

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

- 2025/11/20
- 2025/12/20
- 2026/01/20

-පිටුව 145-

පිළිතුර 10

පහත පරිදි සංශෝධනය විය යුතු ය.

සීමිත හොට් හොට් (පෞද්ගලික) සමාගම 2025/12/31 දිනෙන් අවසන් කාර්තුව සඳහා එකතු කල අගය මත බද්ද ගණනය කිරීම.

නිමවුම් බද්ද

සාමාන්‍ය අනුප්‍රමාණය මත සැපයුම 18%

	$(33{,}062{,}500 + 50{,}312{,}500) \times \frac{18}{118}$	=	12,718,220
(-) යෙදවුම් බද්ද			
සාමාන්‍ය අනුප්‍රමාණය මත ගෙවූ:		-	
අමුද්‍රව්‍ය මත (බදු ඉන්වොයිසි ඇත)	$54{,}625{,}000 \times \frac{18}{118}$	8,332,627	
අමුද්‍රව්‍ය මත (බදු ඉන්වොයිසි නැතිනම් ඉඩ නොදේ)			
විදුලිය (නිදහස්)		-	8,332,627
ගෙවිය යුතු ඉතිරි බදු මුදල (2026/01/20 දිනට හෝ ඊට පෙර)			4,385,593

සටහන: නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා ගෙවීම් කර ඇතොත් එලෙසින් ගෙවූ මුදල් උක්ත 4,385,593 න් අඩු කර ඉතිරිය පමණක් 2026/01/20 දින හෝ ඊට පෙර ගෙවිය යුතුවේ.

-පිටුව 146-

7.4 සරල කළ එකතු කළ අගය මත බදු ක්‍රමය

මාතෘකාව අවසානයට පහත කොටස එක් විය යුතු ය.

(2011.04.01 සිට 2025.09.30 දක්වා ක්‍රියාත්මක විය)

-පිටුව 146/147-

7.4 සරල කළ එකතු කළ අගය මත බදු ක්‍රමය

7.4.3. මාතෘකාව ලෙස පහත කොටස එක් විය යුතු ය.

7.4.3 මෙම සරල කරන ලද බදු ක්‍රමය (SVAT) ක්‍රියාත්මක වූයේ කෙසේද?

-පිටුව 148/149-

7.5 ලෙස පහත කොටස එක් විය යුතු ය.

7.5 අවදානම් මත පදනම් වූ VAT ආපසු ගෙවීම් ක්‍රමවේදය (Risk Based Refund Scheme) ක්‍රියාත්මක කිරීම

සරල කළ අගය එකතු කළ බද්ද (SVAT) ක්‍රමවේදය අහෝසි කිරීමෙන් අනතුරුව, 2025 ඔක්තෝබර් 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවදානම් මත පදනම් වූ VAT ආපසු ගෙවීම් ක්‍රමවේදය (Risk Based Refund Scheme) හඳුන්වා දී ඇත.

මෙම ක්‍රමවේදය, ආපසු ගෙවීම් අයදුම්පත් සඳහා අදාළ සුදුසුකම් ලත් පුද්ගලයන්ට සම්බන්ධ අවදානම් මට්ටම අනුව ඒවා ඇගයීම මගින් VAT ආපසු ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම අරමුණු කර ගනී.

2025 සැප්තැම්බර් 29 දිනැති අංක 2456/02 දරන ගැසට් නිවේදනය මගින් මෙම අවදානම් මත පදනම් වූ VAT ආපසු ගෙවීම් ක්‍රමවේදයට අදාළ කොන්දේසි හා නියමයන් ප්‍රකාශයට පත් කර ඇත.

A අවදානම් මත පදනම් වූ ආපසු ගෙවීම් ක්‍රමවේදය (Risk Based Refund Scheme)

“අවදානම් මත පදනම් වූ ආපසු ගෙවීම් ක්‍රමවේදය” යනු, පෙර නියමිත නිර්ර්ණායක මත පදනම්ව ආපසු ගෙවීම් අයදුම්පත් අවදානම් ඇගයීමකට යටත් කරමින්, ඒවායේ නිවැරදිතාව, බදු අනුකූලතාව සහ සමස්ත බදු ගෙවන්නාගේ හැසිරීම හා විශ්වාසනීයත්වය පිළිබඳ අවදානම හඳුනාගෙන ප්‍රතිපූරණ ක්‍රියාවලිය සිදුකරන ක්‍රමවේදයකි.

මෙම ඇගයීම අනුව සුදුසුකම් ලත් පුද්ගලයින් පහත පරිදි වර්ග කරනු ලැබේ:

- අඩු අවදානම් (Low Risk)
- මධ්‍යම අවදානම් (Medium Risk)
- ඉහළ අවදානම් (High Risk)

අඩු හෝ මධ්‍යම අවදානම් කාණ්ඩයට ඇතුළත් වන පුද්ගලයින්ට, අයදුම්පත පෙර සත්‍යාපනය කිරීමකින් තොරව ආපසු ගෙවීම් ලබා ගැනීමට හැකියාව ඇත. කෙසේ වෙතත් අවශ්‍ය වන අවස්ථාවලදී, එම ආපසු ගෙවීම් බදු නිලධාරීන් විසින් පූර්ව සත්‍යාපනයකට යටත් කළ හැකිය.

ඉහළ අවදානම් කාණ්ඩයට අයත් වන පුද්ගලයින්ට, ආපසු ගෙවීම් ලබා දෙනු ලබන්නේ පෙර සත්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

B මෙම ක්‍රමවේදය යටතේ ﾂﾂ ආපසු ගෙවීම් ඉල්ලීමට සුදුසු පුද්ගලයින්

මෙම ක්‍රමවේදය යටතේ VAT ආපසු ගෙවීම් ඉල්ලිය හැකි පුද්ගලයින් පහත පරිදිය:

i. සුදුසුකම් ලත් අපනයනකරු (Eligible Exporter)

2002 අංක 14 දරන අගය එකතු කළ බද්ද පනතේ 83 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි සුදුසුකම් ලත් අපනයනකරුවෙකු.

ii. උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියකට සැපයුම්කරුවෙකු (Supplier to a Strategic Development Project)

බදු කාලසීමාව තුළ, තම භාණ්ඩ හෝ සේවා සැපයීම්වල මුළු වටිනාකමෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක්, 2008 අංක 14 දරන Strategic Development Projects Act හි 3(4) උපවගන්තිය යටතේ හඳුනාගත් උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියකට සැපයූ ලියාපදිංචි පුද්ගලයෙකු.

iii. නිශ්චිත ව්‍යාපෘතියකට සැපයුම්කරුවෙකු (Supplier to a Specified Project)

බදු කාලසීමාව තුළ, තම භාණ්ඩ හෝ සේවා සැපයීම්වල මුළු වටිනාකමෙන් 50% කට වඩා වැඩි ප්‍රමාණයක්, VAT පනතේ පළමු උපලේඛනයේ II කොටසේ (f) ඡේදයේ (ii) හෝ III කොටසේ (b) ඡේදයේ (xxi) අනුපාතය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිශ්චිත ව්‍යාපෘතියක් ලෙස හඳුනාගත් ව්‍යාපෘතියකට සැපයූ ලියාපදිංචි පුද්ගලයෙකු.

iv. VAT පනතේ 22(7) වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘතියක්

VAT පනතේ 22(7) වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ අදාළ ව්‍යාපෘතිය.

අවදානම් නිර්ණායක සංවර්ධනය හා අවදානම් ශ්‍රේණිගත කිරීම

1. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, බදු ගෙවන්නාගේ නිවැරදිතාව, අනුකූලතාව, හැසිරීම සහ විශ්වාසනීයත්වය ඇගයීමට අදාළ නිර්ණායක සංවර්ධනය කරනු ඇත.
2. එම නිර්ණායක මත පදනම්ව, සුදුසුකම් ලත් පුද්ගලයින්:
   - අඩු අවදානම්,
   - මධ්‍යම අවදානම්, හෝ
   - ඉහළ අවදානම්

   යන කාණ්ඩවලට වර්ගීකරණය කරනු ලැබේ.
3. මෙම අවදානම් ශ්‍රේණිගත කිරීම 2025 ඔක්තෝබර් 1 දින ආරම්භ වන බදු කාලසීමාවෙන් බලපැවැත්වෙන අතර, එය නැවත සමාලෝචනය කරන තෙක් හෝ අවලංගු කරන තෙක් ක්‍රියාත්මක වේ.
4. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් මෙම අවදානම් ශ්‍රේණිගත කිරීම සෑම මාස හයකට වරක් හෝ අවශ්‍ය යැයි සලකන ඕනෑම අවස්ථාවක සමාලෝචනය කරනු ඇත.

-පිටුව 148/149-

7.5 මාතෘකාව (**සංචාරකයින් සඳහා එකතු කළ අගය මත බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය (Tourist VAT Refund Scheme (TVRS)**)) 7.6 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 150/151-

7.6 මාතෘකාව (**මූල්‍ය සේවා මත එකතු කළ අගය මත වූ බද්ද (පනතේ 25 අ - 25 ඒ වගන්තිය)**) 7.7 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 151-

7.7.1.5 බදු අනුපාතය (7.6.1.5 බදු අනුපාතය මාතෘකාව 7.7.1.5 ලෙස වෙනස් විය යුතු ය.)
පහත කොටස එක් විය යුතු ය.

2026.07.01 දින සිට 20.5%

-පිටුව 151-

පිළිතුර 14
(iv) පහත පරිදි සංශෝධනය විය යුතු ය.

(iv) 2022.01.01 සිට 2026.06.30 දක්වා මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු අනුපාතය 18% කි.

-පිටුව 152/153/154/155-

7.7 මාතෘකාව (**මුද්දර ගාස්තු**) 7.8 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 155/156/157-

7.8 මාතෘකාව (**කොටස් හුවමාරු බද්ද (Share Transaction Levy)**) 7.9 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 157/158-

7.9 මාතෘකාව (**සංචාරක සංවර්ධන බද්ද (TDL)**) 7.10 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 158/159-

7.10 මාතෘකාව (**සුරා බදු (විශේෂ විධිවිධාන පනත යටතේ පනවන ලද සුරා බද්ද)**) 7.11 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 159/160/161/162-

7.11 මාතෘකාව (**2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත**) 7.12 ලෙස සංශෝධනය විය යුතු අතර අනු මාතෘකා ද ඒ අනුව සංශෝධනය විය යුතු ය.

-පිටුව 160-

අනු අංකය (3) පහත පරිදි සංශෝධනය විය යුතු ය.

3. ලියාපදිංචි වීම (4 වන වගන්තිය)

යම් ද්‍රව්‍යයක් ආනයනය කරන තැනැත්තෙකු හැර බදු අය කළ හැකි සෑම තැනැත්තෙකුම (2වන වගන්තියේ දක්වා ඇති) ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

(i) 2024.01.01 සිට 2026.06.30 දක්වා යම් තැනැත්තෙකු කාර්තුවකට පිරිවැටුම රු. 15,000,000/- හෝ අනුයාත කාර්තු 4ක පිරිවැටුම රු.මි. 60 ඉක්මවන්නේ නම්, 2026 ජූලි 01 වන දින සිට කාර්තුවක පිරිවැටුම රු. මිලියන 9ක් හෝ අනුයාත කාර්තු 4ක පිරිවැටුම රු. මිලියන 36 ඉක්ම වන්නේ නම්,

කාර්තුවකට රුපියල් මිලියන 30 ඉක්මවන දින සිට දින පහළොවකට නොඅඩු කාල පරිච්ඡේදයක් තුළ

-පිටුව 161-

වගුවට පසුව ඇති '2002 අංක 14 දරන....' ඡේදයෙන් අනතුරුව පහත කොටස එක් විය යුතු ය.

2026.07.01 දින සිට මූල්‍ය සේවා බදු නිදහස් වේ.

-පිටුව 163-

සාරාංශය

'එකතුකල අගය මත වු බදු **(VAT)**' හි දෙවන අනු කොටස ලෙස පහත කොටස එක් විය යුතු ය.

සරල කල එකතු කල අගය මත බදු (S VAT) හා අවදානම් පාදක ආපසු ගෙවීමේ යෝජනා ක්‍රමය

-පිටුව 163-

සාරාංශය

'සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද' හි පළමු අනු කොටසට පසුව පහත කොටස එක් විය යුතු ය.

- ලියාපදිංචිය
- වාර්තා
- ගෙවීම්

-පිටුව 164-

විසඳුම්

(3) පහත පරිදි සංශෝධනය විය යුතු ය.

3) • 2026.01.31 වන දින හෝ ඊට පෙර

• 2025.11.20
2025.12.20
2026.01.20